# ඉඩම් හිමිකාරීත්වය වෙනස් කිරීම (දීමනාපත්‍ර ඉඩමක් බැහැර කිරීම)

දීමනාපත්‍රකරු හට තම දීමනාපත්‍රය තම ඥාතියෙකුට හෝ පිටස්තර පුද්ගලයෙකු හට සම්පූර්ණ ඉඩම හෝ ඉන් කොටසක් බැහැර කළ හැකි වේ.

## ඥාතියෙකු වෙත දීමනාපත්‍රය ඉඩම බැහැර කිරීම

1. බැහැර කිරීම සඳහා අවසර ඉල්ලන ලද ඉල්ලීමේ ලිපිය
2. ප්‍රදාන පත්‍රයේ මුල් පියපත හා ඡායා පිටපත්
3. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් මෑතකදී ලබාගත් පත් ඉරු සටහනක් (මාස 03ක් ඇතුළත)
4. ග්‍රාම නිලධාරී නිර්දේශ වාර්තාව
5. බැහැර කිරීම සිදු කරනුයේ ප්‍රදාන පත්‍රයේ සඳහන් ඉඩම් කොටසක් නම් ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය මත අදාළ ඉඩම මැනුම් කර බැහැර කරන කොටස දැක්වෙන පිඹුර හා එහි පිටපත් 01
6. බැහැර කිරීමට එකඟතාවය කට්ටිකරුවන්ගෙන් හා යැපෙන්නන්ගෙන් ලබාගත යුතුය. (රු.50.00 මුද්දරයක් මත දිවුරුම් ප්‍රකාශ මගින්)
7. පැවරුම්ලාභියා III වන උපලේඛනය යටතේ වන අයෙකු නම් ඒ බව සනාථ කිරීම සඳහා අදාළ ලේඛන
8. ප්‍රදාන පත්‍රය සහිත සම්පූර්ණ ඉඩම බැහැර කිරීමට අවසර ඉල්ලා සිටී නම් කට්ටිකරු අනාථ නොවන බව සනාථ කිරීම සඳහා අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතුය. (ඔප්පු පිටපත් මෑතකදී ලබාගත් පත්තිරු සටහන් සමඟ)

## පිටස්තර පුද්ගලයෙකු වෙත දීමනාපත්‍ර ඉඩම බැහැර කිරීම

1. බැහැර කිරීම සඳහා අවසර ඉල්ලන ලද ඉල්ලීමේ ලිපිය
2. ප්‍රදාන පත්‍රයේ මුල් පිටපත හා ඡායා පිටපත්
3. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් මෑතකදී ලබාගත් පත් ඉරු සටහනක් (මාස 03ක් ඇතුළත)
4. ග්‍රාම නිලධාරී නිර්දේශ වාර්තාව
5. බැහැර කිරීම සිදු කරනුයේ ප්‍රදාන පත්‍රයේ සඳහන් ඉඩම් කොටසක් නම් ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය මත අදාළ ඉඩම මැනුම් කර බැහැර කරන කොටස දැක්වෙන පිඹුර හා එහි පිටපත් 01
6. බැහැර කිරීමට එකඟතාවය කට්ටිකරුවන්ගෙන් හා යැපෙන්නන්ගෙන් ලබාගත යුතුය. (රු.50.00 මුද්දරයක් මත දිවුරුම් ප්‍රකාශ මගින්)

7. ප්‍රදාන පත්‍රය සහිත සම්පූර්ණ ඉඩම බැහැර කිරීමට අවසර ඉල්ලා සිටී නම් කට්ටිකරු අනාථ නොවන බව සනාථ කිරීම සඳහා අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතුය. (ඔප්පු පිටපත් මෑතකදී ලබාගත් පත්තිරු සටහන් සමඟ)
8. පැවරුම්ලාභියා III වන උපලේඛනය යටතේ ගණන් ගත නොහැකි නම් පැවරුම්ලාභියා හට නියමිත ආදායම් තත්ත්වයේ හා වෙනත් ඉඩම් නොමැති බව සනාථ කිරීමට ලේඛන ඉදිරිපත් කළ යුතුය.